## පහත මාතෘකා ඔස්සේ නව යුවල දැනුවත් කිරීම මෙහිදී සිදුවෙයි.

- අන්‍යෝන්‍ය අවබෝධය, විශ්වාසය හා කැපවීම තුලින් යහපත් අඹු - සැමි සම්බන්ධතාවයක් ගොඩනගා ගන්නා අයුරු.
- තෘප්තිමත් ලිංගික සම්බන්ධතාවයක් තුලින් සාර්ථක යුග දිවියක් ගත කරන අයුරු.
- අඹු සැමි දෙපළ උතුම් වූ මවුපිය පදවිය සඳහා සූදානම් විය යුතු අයුරු.
- දරුවෙකු පිළිසිඳ ගන්නා ආකාරය හා නිරෝගී දරු පිළිසිඳ ගැනීමක් සඳහා සූදානම් විය යුතු අයුරු.
- දෙදෙනාගේ බලාපොරොත්තු හා අවශ්‍යතා වලට ගැලපෙන අයුරින් පවුල් සැලසුම් කර ගන්නා අයුරු.
- නිවැරදි පෝෂණය ලැබෙන ලෙස ආහාර වේල් සකසා ගන්නා අයුරු.
- ඇතිවිය හැකි රෝග තත්ත්ව හඳුනා ගැනීම හා ප්‍රතිකාර ලබා ගන්නා අයුරු.

- යුග දිවියට පිවිසෙද්දී සිත් තුල ඇතිකර ගන්නා බලාපොරොත්තු හා සතුට ඉදිරි මුළු දිවිය පුරාම නොනැසී පැවතීමට ශක්තිමත් අඩිතාලමක් නව දිවි සුව සත්කාර සේවාව මගින් ඔබට සැපයෙනු ඇත.
- ඒ සඳහා ඔබ කළ යුත්තේ ඔබගේ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය මගින් පවත්වනු ලබන නව දිවි සුව සායන සැසි සඳහා පැමිණීමයි.
- **මේ යටතේ සැසි වාර දෙකක් පැවැත්වෙන අතර මෙම සැසි වාර දෙකම සඳහා ඔබ දෙදෙනාගේම පැමිණීම අපේක්ෂා කෙරේ.**
- **සායනය පිළිබඳ සියළු තොරතුරු ඔබේ ගමේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියගෙන් ලබා ගැනීමට හැකිය.**

**යුග දිවිය**
**සුවෙන් සතුටින් ගෙවන්නට අවැසි**
**මෙම සේවාව ලබන්නට ඔබ දෙදෙනාම,**
**සැසි දෙකටම නොවරදවාම එන්න.**

# සොඳුරු කැදැල්ලකට
# සුවහසක් සුභපැතුම් !



## "නව දිවි සුව සත්කාර සේවාව"

**නවක විවාපත් වූ ඔබ සඳහාමයි**

**පවුල් සෞඛ්‍ය කාර්යාංශය**
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
කොළඹ 10.

## නව දිවි සුව සත්කාර සේවාව යනු කුමක්ද ?

නැවුම් බලාපොරොත්තු හා අපේක්ෂාවන් පෙරදැරිව නව දිවියට පා නැගූ ඔබ දෙපලට සතුට පිරුණු යහපත්, සෞඛ්‍යමත් ජීවිතයක් සඳහා ලැබෙන අත්වැලකි.

## නව දිවි සුව සත්කාර සේවයේ අරමුණු මොනවාද ?

- ප්‍රජනක සෞඛ්‍ය ගැන ඔබ දැනගත යුතුම කරුණු පිළිබඳ අවබෝධය ලබා දීම මඟින් සාර්ථක ලිංගික සම්බන්ධතාවයකට මඟ පෑදීම.
- ඔබ දෙපලගේම පවත්නා සෞඛ්‍ය ගැටළු, මවුපිය භාවය ලැබීමට පෙර හඳුනාගෙන ඒවා නිවැරදි කිරීම හෝ අවම කිරීම.
- දරු පිළිසිඳ ගැනීමකට පෙර කාන්තාවගේ සෞඛ්‍ය තත්වය උපරිම අයුරින් වර්ධනය කර ගැනීම මඟින් ගර්භණී සමයේ හා දරු ප්‍රසූතියේ දී මවට හා දරුවාට ඇති විය හැකි සෞඛ්‍ය ගැටළු අවම කර ගැනීම.
- මාතෘ මරණ හා ළදරු මරණ හැකි උපරිමයෙන් අවම කර ගැනීම.

## නව දිවි සුව සත්කාර සේවා සැසිවලදී ඔබට සැලසෙන සේවාවන්



- නව යුවලගේ තොරතුරු ලබාගෙන, පවත්නා සෞඛ්‍ය ගැටළු හඳුනා ගැනීම.
- නව යුවල වෛද්‍යවරයෙකුගේ පරීක්ෂාවට ලක් කිරීම.





- උස හා බර මැන පෝෂණ තත්වය ගණනය කිරීම හා අදාළ පෝෂණ උපදෙස් ලබා දීම.
- රුධිර පරීක්ෂණ සිදු කිරීම (උදා: රුධිර වර්ගය, රුධිරයේ හිමොග්ලොබින් ප්‍රමාණය, රුධිරයේ සීනි මට්ටම)



- හඳුනා ගත් රෝග තත්ත්ව සඳහා අවශ්‍ය ප්‍රතිකාර කිරීම හෝ ප්‍රතිකාර සඳහා යොමු කිරීම.
- විශ්වාසනීයත්වය හා රහස්‍ය භාවය සුරකිමින්, හඳුනාගත් ගැටළු නිරාකරණයට අවශ්‍ය මඟ පෙන්වීම.
- යහපත් හා සාර්ථක දිවියක් උදෙසා වැදගත් වන මාතෘකා ඔස්සේ නව යුවලට දැනුම හා අවබෝධය ලබා දීම.

